**ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව - 2022**

**-----------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා  මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ  වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වත්කම් පන්ති 5 ක පිරිවැය රු.28,766,620 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 ප්‍රකාරව එම ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 ප්‍රකාරව ප්‍රතිශෝධන කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වේ. පිරිවැය රු.28,766,620 ක් වන ස්ථාවර වත්කම් ශ්‍රී.ල.රා.ගි. ප්‍රමිත 7 ප්‍රකාරව ඵලදායී ජීවකාලය නැවත සමාලෝචනය කිරීමට කටයුතු කරමින් පවතින අතර ඉදිරි ගිණුම් වර්ෂය තුළදී වත්කම් තුළ ගැළපීම් කිරීමට කටයුතු කරනු ලැබේ. | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් නැවත තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෘෂි වන වගාව පිළිබඳ පර්යේෂණ සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICRAF) සහ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව අතර ඇතිකරගෙන තිබුණු පර්යේෂණ හා විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගිතාව සඳහාවන “කෘෂි වන වගාව” පිළිබඳ අවබෝධතා ගිවිසුම අනුව ආරම්භකළ CARP-ICRAF Tree Domestication නැමති ව්‍යාපෘතියට ලබාගත් අංක JW-3904 දරන මොටර් රථය එම ව්‍යාපෘතිය නමින් ලියාපදිංචි කර ඇතත් අදාළ ව්‍යාපෘතිය නිම වීමෙන් පසු, ප්‍රතිපත්ති සභාවට පවරා නොගෙන එවකට සම්බන්ධීකරණ විද්‍යාඥ ලෙස කටයුතු කරන ලද වර්තමානයේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු විසින් පුද්ගලික පරිහරණයට යොදාගෙන තිබුණි. | ලේඛනගත තොරතුරු කිසිවක් සභාව භාරයේ නොමැති නිසා වත්කමක් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කිරීමට නොහැකි විය. රජයේ විගණන අංශයේ නිර්දේශ මත සභාව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | වාහනය සභාව වෙත පවරාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව පවතින ගොඩනැගිල්ලට කොටසක් එකතු කරගැනීම සඳහා එම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2019 වර්ෂයේදී ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව රු.12,945,000 කට ඇස්තමේන්තු කර රු.12,300,000 කට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට පිරිනමා තිබුණි. ඔවුන් සමග ඇතිකරගත් අවබෝධතා ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව වැඩ නිම කළ යුතු දිනය 2020 අප්‍රේල් 30 දින මුත් වැඩ අවසන් කර නොතිබුණු අතර 2022 ඔක්තෝබර් 10 දින වන විට සහතික කළ වැඩවල වටිනාකම රු.5,516,590 ක් වුවත් ඔවුන් වෙත රු.12,217,303 ක මුදලක් ගෙවා තිබුණු හෙයින් සහතික නොකළ වැඩ සඳහා රු.6,700,713 ක් වැඩිපුර ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. | 2020 ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන් නොවීම හේතුවෙන්, ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නවතා දමා තිබුණි. ඒ අනුව ගිවිසුම ප්‍රකාරව ඉතිරි මුදල ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ඉල්ලුම් කළ අතර, 2021 වසරේ සහ 2022 වසරේ වෙන් කරන ලද මුදලින් ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කර ගෙන යාම සඳහා ගිවිසුම ප්‍රකාරව මුදල් ගෙවන ලදී. | කොන්ත්‍රාත්තුව අප්‍රමාදව ඉටුකරවා ගත යුතුය. |
| (ඇ) | කෘෂි වන වගාව පිළිබඳ පර්යේෂණ සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICRAF) සහ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව අතර ඇතිකරගෙන තිබුණු පර්යේෂණ හා විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගිතාව සඳහා වන අවබෝධතා ගිවිසුම යටතේ ක්‍රියාත්මක කරන ලද "කෘෂි වන වගාව" පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා කෙන්යා පර්යේෂණ මධ්‍යස්ථානයකින් ලද මූල්‍යාධාරවලින් ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ අංක 2323246 දරන ව්‍යාපෘති බැංකු ගිණුමෙහි පැවති රු.1,232,755 ක ශේෂය මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි. | සභාවේ ලේකම්/අධ්‍යක්ෂක විසින් ලංකා බැංකු ටොරින්ටන් ශාඛාවේ කළමනාකරු වෙත දැනුම් දී 2015.01.15 දින මේ ගිණුම සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව පරීක්ෂණයක් සිදු කරමින් පවතින අතර ගිණුමේ ශේෂය සම්බන්ධව අවසන් නිගමනය ලැබෙන තෙක් මෙම ශේෂය සභාව වෙත පවරාගෙන භාණ්ඩාගාරය වෙත මෙතෙක් ප්‍රේෂණය කර නොමැති අතර 2022 මූල්‍ය ප්‍රකාශනවල මේ පිළිබඳව හෙළිදරව් කර ඇත. | අපරාධ පරීක්ෂණයෙහි ප්‍රගතිය විමසා ඒ අනුව කටයුතු කිරීමත්, බැංකු ශේෂය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමත් කළ යුතුය. |

## 1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| **අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ප්‍රතිපත්ති සභාවේ හිටපු සභාපතිවරයාගේ ධූර කාලය 2018 නොවැම්බර් 07 දින අවසන් වී ඇතත් 2018 නොවැම්බර් 07 දින සිට 2018 දෙසැම්බර් 31 දක්වා මාස දෙකකට ආසන්න කාලය සඳහා රු.197,600 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවා ඇතත් එම මුදල මේ දක්වා අයකර ගෙන නොතිබුණි. | මෙම දීමනා අය කර ගැනීම සම්බන්ධයෙන් වන සභා මණ්ඩල තීරණය විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කර ඇත. | අදාළ ගෙවීම්, නිර්දේශ කළ, අනුමත කළ සහ ගෙවීම සිදු කළ පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය. |

### 1.6 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ පශ්චාත් උපාධි සඳහා විදේශගත වූ ජාතික කෘෂි පර්යේෂණ පද්ධතියේ පර්යේෂකයින් 25 දෙනෙකු කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රතිපත්ති සභාවට නොදන්වා මෙරටට පැමිණ සිටිය මුත් එම කාලසීමාව සඳහා ගෙවා තිබුණු රු.10,049,580 ක යැපුම් දීමනාව ආපසු අයකරගෙන නොතිබුණි. | විදේශීය අධ්‍යයන කාල සීමාව තුළ සහා අනුමැතියකින් තොරව ශ්‍රී ලංකාවට පැමිණීම නිසා අය කර ගත යුතු මුදල 2023/04/28 වන දිනට රු.8,828,025 කි. මෙම මුදල අය කර ගැනීම සඳහා ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇත. තව ද, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ප්‍රකාරව කෘෂිකර්ම දෙපාරතමේන්තුවේ සහ ඊට අනුයුක්ත ආයතනයන්හි ශිෂ්‍යයන් කිහිප දෙනෙකු වෙතින් මෙම මුදල් වාරික වශයෙන් අය කර සභාව වෙත යොමු කරනු ලබයි. | මෙරටට පැමිණි කාලසීමාවට අදාළ යැපුම් දීමනාව අයකරගත යුතුය. |
| (ආ) | කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු සඳහා, පර්යේෂණ ආයතන 3 කට හා විශ්වවිද්‍යාල 3 කට ලබාදුන් මුදල්වලින්, ඉතිරිව ඇති රු.459,131 ක් මෙතෙක් සභාව වෙත ගෙන්වා නොගෙන 2006 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් තිබුණි. | කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු සඳහා පර්යේෂණ ආයතන හා විශ්වවිද්‍යාලවලට ලබාදුන් මුදලින් ආයතනයට අයවිය යුතු මුදල රු.659,131 ක් වුවත් රුහුණු විශ්වවිද්‍යාලය රු.200,000 ක බිල්පත් සභාවට යොමු කර ඇති බැවින් එම මුදල රු.459,131 ක් විය. එසේම අනිකුත් ආයතන වෙත අයවිය යුතු මුදල සඳහන් කර කිහිපවතාවක් ලිපි යොමු කර ඇතත් පිළිතුරු නොලැබීම හේතුවෙන් සිහිකැඳවීම් ලිපිද එම ආයතන වෙත යොමු කර ඇත. | අදාළ පාර්ශවයන්ගෙන් ඉතිරිව ඇති මුදල් අයකර ගත යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනතෙහි 10 (ඌ) උප වගන්තිය. | අන්තර් ආයතනික කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති සඳහා කටයුතු සැලසීම හා මුදල් සැපයීම සභාවේ කර්තව්‍යයක් වුවත් පසුගිය වර්ෂයේදී ව්‍යාපෘති 4 ක් ආරම්භ කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී නව ව්‍යාපෘති හඳුනාගෙන හෝ ඒ සඳහා මුදල් සපයා නොතිබුණි. | 2022 වසර සඳහා නව ව්‍යාපෘති ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ පර්යේෂකවරු විසින් යොමු කර නොතිබීම හේතුවෙන් 2022 වර්ෂය සඳහා මෙම වැඩසටහනට අදාළව නව ව්‍යාපෘති ක්‍රියාත්මක නොවුණි. | පනත ප්‍රකාරව පර්යේෂණ ව්‍යාපෘති සඳහා කටයුතු සැලසීම කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.13,108,798 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.6,931,190 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,177,608 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මෙහෙයුම් වියදම් වැඩි වීමට සාපේක්ෂව භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදාන රු.6,095,124 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 ඔක්තෝබර් 04 දිනැති අංක අමප/17/1992/728/34 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මැලේසියාව, තායිලන්තය හා පිලිපීනය වැනි රටවලදී වසරකට 30 දෙනා බැගින් වසර 5 ක් තුළ පර්යේෂකයින් 150 ක් දර්ශනපති උපාධිය (Ph.D) හැදෑරීම සඳහා යොමු කළ යුතු අතර ඔවුන් විසින් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය දැනට මුහුණ දෙන හෝ ඉදිරියේදී මුහුණ දීමට සිදුවිය හැකි ගැටලු හා ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු කරමින් තම පර්යේෂණ මාතෘකාව තෝරා ගත යුතුය. සමාලෝචිත වර්ෂය වන විට එම තීරණයට වසර 5 ක් ගතවී තිබුණද, කොවිඩ් වසංගත තත්ත්වය සහ මූල්‍ය දුෂ්කරතා නිසා ඒ සඳහා යොමුකළ පර්යේෂකයින් සංඛ්‍යාව 79 දෙනෙකු පමණක් වූ අතර එම පර්යේෂකයින් අතරින්ද ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා වැඩි දියුණු කළ යුතු යැයි හඳුනාගෙන ඇති කෘෂිකාර්මික යාන්ත්‍රීකරණය හා කාබනික කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙන් පර්යේෂණ මාතෘකාව තෝරාගෙන තිබෙනුයේ නිලධාරීන් 8 දෙනෙකු පමණක් බව නිරීක්ෂණය විය. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මේ සඳහා යොමු කරවීමට හැකි වූයේ පර්යේෂකයන් 79 දෙනෙක් වූ අතර එම පර්යේෂකයන් ගේ පර්යේෂණ මාතෘකා ඔවුන්ගේ ආයතනවලට අත්‍යාවශ්‍යව තිබූ ක්ෂේත්‍රයන් අනුව තෝරා ගන්නා ලදී. | නිර්දේශිත පර්යේෂණ මාතෘකා තෝරා ගැනීම සඳහා පර්යේෂකයින් ධෛර්යමත් කළ යුතුය. |
| (ආ) | කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති සඳහා අරමුදල් සපයන "ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම" (NARP) නම් වූ කෘෂිකර්ම අමාත්‍යාංශයෙහි පවතින ව්‍යාපෘතිය සිදු කරනු ලබන පර්යේෂණවල අවසන් වාර්තා සභාව විසින් සමාලෝචනය කළ යුතු වුවත් 2015 සිට 2020 දක්වා කාලයට අදාළව නිම කිරීමට නියමිතව පැවති පර්යේෂණ 4 ක අවසන් වාර්තා කාලීනව ලබා ගෙන සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සමාලෝචනය කර නොතිබුණි. | පර්යේණ ව්‍යාපෘති සඳහා අරමුදල් සපයන ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම (NARP) ව්‍යාපෘතියේ 2015 සිට 2020 දක්වා කාලයට අදාළව අවසන් පර්යේෂණ වාර්තා 04 ක් පර්යේෂකයින් විසින් ලබා දී නොමැති අතර මේ පිළිබඳව සිහිකැඳවීම් සිදු කර ඇත. | පර්යේෂණවලට අදාළ අවසන් වාර්තා කාලීනව ලබා ගෙන සමාලෝචනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රතිපත්ති සභාව විසින් කාබනික කෘෂිකර්මාන්තය සඳහා අවධානය යොමු කිරීමේ වැදගත්කම හඳුනාගෙන එම ක්ෂේත්‍රයන්හි පර්යේෂණ වැඩි කළ යුතු ප්‍රමුඛතා ක්ෂේත්‍ර 07 ක් ශ්‍රී ලංකාවේ පවතින පර්යේෂණ ආයතන වෙත හඳුන්වාදී තිබුණද, කාබනික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය සහ වර්තමානයේ වෙළඳපලේ පවතින කාබනික ආහාරවල ගුණාත්මක තත්ත්වය සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කිරීම සඳහා 2017 වර්ෂයේ සිට පර්යේෂණ ආයතන උනන්දු කර නොතිබුණි. | කාබනික කෘෂිකර්මාන්තය සඳහා කමිටුවක් පිහිටුවා 2019 මේ පිළිබඳව වැඩමුළු 02 ක් පවත්වා ඇත. තවද 2020 වසරේ සිට NARP සඳහා ව්‍යාපෘති කැඳවීමේ දී කාබනික කෘෂිකර්මාන්තය පිළිබඳ පර්යේෂණ යෝජනාවලට ප්‍රමුඛතාවය දීමට කටයුතු සිදු කර ඇත. එමගින් ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය තුළ පර්යේෂකවරුන්ගේ උනන්දුව ඇති කිරීමට කටයුතු සිදු කර ඇත. | සැලසුම් ප්‍රකාරව කටයුතු කිරීම සඳහා පර්යේෂණ ආයතන ධෛර්යමත් කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බංග්ලාදේශ කෘෂිකාර්මික පර්යේෂණ සභාව, මැලේසියානු කෘෂිකාර්මික පර්යේෂණ සභාව සහ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව අතර 2011 හා 2016 වර්ෂවලදී ඇතිකරගත් අවබෝධතා ගිවිසුම් අනුව කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ උපදේශකයින් හා විද්‍යාඥයින් හුවමාරු කිරීම යටතේ කෙටිකාලීන විදේශ පුහුණුවීම් සඳහා නිලධාරීන් යොමුකිරීමට 2019, 2020 සහ 2021 වර්ෂවල ක්‍රියාකාරී සැලසුම්හි දක්වා තිබුණද අදාළ රාජ්‍යයන් වෙතින් ප්‍රතිචාර නොලැබීම සහ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් එවැනි පුහුණුවීම් අවස්ථා සඳහා නිලධාරීන් යොමුකර නොතිබුණි. | අදාළ රාජ්‍යයන් වෙතින් ප්‍රතිචාර නොලැබීම සහ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවනේ එවැනි පුහුණු අවස්ථා සඳහා නිලධාරින් යොමු කිරීමට නොහැකි විය. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ නොහැකි නම් ඒවායින් ඉවත්වීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කෘෂිකාර්මික අතථ්‍ය පුස්තකාල (Virtual Library) පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා පසුගිය වර්ෂයේදී සැලසුම් කර විගණිත දින වන විටත් එම පද්ධතිය ස්ථාපනය කර නොතිබුණි. | Agri-net ස්ථාපනය සඳහා වැඩමුළුවක් පැවැත්වීමට අරමුණු කර තිබුණ ද කොවිඩ් වසංගත කාලය තුළ තිබුණු අවහිරතා සහ ප්‍රාග්ධන අරමුදල් ප්‍රමාණවත් පරිදි නොලැබීම හේතුවෙන් වැඩමුළුව පැවැත්වීමට නොහැකි විය. | සැලසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ඇ) | ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව මඟින් පසුගිය වර්ෂයේදී පැවැත්වීමට සැලසුම් කර තිබුණු ජාතික සම්මාන උළෙල (SLCARP National Awards) සඳහා අයදුම්පත් කැඳවා, ඇගයීම් කමිටු පත්කර, ඇගයීම් කටයුතු අවසන් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම සම්මාන උළෙල පවත්වා නොතිබුණි. | සභාව 2021 වසරේ දී පැවැත්වීමට සැලසුම් කර තිබුණු ජාතික සම්මාන උළෙල සඳහා අයදුම්පත් කැඳවා ඇගයීම් කටයුතු අවසන් කර තිබුණ ද භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන අරමුදල් ලබා ගැනීමට අපහසු වීම හේතුවෙන් මෙම උළෙල පැවැත්වීමට 2022 වසරේ දී නොහැකි විය. | සැලසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය |